විද්‍යාලය : ර/ ඇඹිලිපොල ශ්‍රී මහින්ද මහා විද්‍යාලය
සිංහල භාෂාව හා සාහිත්‍යය : 13 ශ්‍රේණිය පැවරුම්
විෂය භාර ගුරු : ඊ.ඒ.එස්.එච්. ඇතුල්දුර

**නිර්දේශිත ග්‍රන්ථය : පේමතෝ ජායතී සෝකෝ**

**ප්‍රශ්නය : පේමතෝ ජායතී සෝකෝ නාට්‍යය ප්‍රේක්ෂක ආකර්ශනයට පාත්‍ර වන්නේ චරිත හා අවස්ථා නිරූපණය සඳහා කාව්‍යමය භාෂා ව්‍යවහාරයක් උපයෝගී කරගත් බැවිනි. නිදසුන් දක්වමින් සාකච්ඡා කරන්න.**

**පිළිතුර සඳහා මග පෙන්වීම :**

- **සරච්චන්ද්‍රයන් විසින් ........... මෙකී නාට්‍ය නිර්මාණ ශ්‍රී ලාංකේය ප්‍රේක්ෂක ජනයාගේ රසෝද්දීපනයට දායාද කළ බව.**
- **නාට්‍යකරුවාගේ මාධ්‍යය වන්නේ සතරවිධ අභිනයයි.**
- **වාචිකාභිනයේ දී භාෂාව වැදගත් වේ.**
- **සංස්කෘත නාට්‍යකරුවෝ 'නාට්‍යය' යන්න දෘශ්‍ය කාව්‍ය යනුවෙන් ව්‍යවහාර කළේ එබැවිනි.**
- **ශෛලිගත හෙවත් නාට්‍ය ධර්මී සම්ප්‍රදායට අනුගත වෙමින් සද්ධර්මාලංකාරයේ එන ස්වර්ණතිලකා කතා වස්තුවේ නාට්‍යෝචිත පාත්‍රෝචිත අවස්ථා පමණක් තෝරා-බේරාගෙන චරිත හා සිදුවීම් නිර්මාණය කර තිබෙන බව.**
- **නාට්‍ය ආරම්භයේ ම බෞද්ධ මූලාශ්‍ර ආශ්‍රයෙන් ගාථා කිහිපයක් අන්තර්ගත කරමින් මිනිස් ජීවිතයේ යතාර්ථවාදී ස්වරූපය ධර්මාවවාද ලෙස ඉදිරිපත් කරන අයුරු ;**
  **නිදසුන : ''මරණ පහුරේ නැගී නෙක වර ....''**
- **දුටුදුටුවන්ගේ නෙත්සිත් පිනවන ස්වර්ණතිලකාගේ රූප සෞන්දර්යය අනුප්‍රාස රසයෙන් යුතු ව වර්ණනා කර ඇති ආකාරය.**
  **නිදසුන : ''ස්වර්ණතිලකා වීය ඇගෙ නම ....''**
- **සංවාද කාව්‍යමය සුගායනයෙන් අලංකෘත වී ඇති අයුරු ;**
  **නිදසුන : ''ළඳකගේ ඇස් මිණි පහන් ලෙස ....''**
- **ස්වර්ණතිලකාගේ උදාර ගතිගුණ සපිරි චරිත ස්වභාවය කාව්‍යමය බසින් සුපෝෂිත වූ අයුරු ;**
  **නිදසුන : ''ඇදුරුතුමා වන්න මගේ ....''**
- **අපූරු උපමා ඇසුරින් උද්දාල බමුණාගේ චරිතයේ සැබෑ ස්වරූපය පාඨක හදවතට කාවද්දයි;**
  **නිදසුන : ''ගල් ටැඹක් සේ නොසැලෙනා අප**
  **ඇදුරුතුම අද පරඬැලක් සේ ....''නාට්‍ය පුරාවට ම කාව්‍යමය බසින් ප්‍රේක්ෂක සිත්සතන් ඇදබැඳ තබාගනිමින් ලොව පවත්නා සදාතන දහමක් රසවත් ව අවබෝධ කිරීමට සරච්චන්ද්‍රයන් සතු වූ කුසලතාව අගයමින් පිළිතුර ලියන්න.**